**2025-10-27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. රජයේ විවිධ ආයතන සතු ඌන උපයෝජිත හෝ අර්ධ වශයෙන් නිම කර ඇති ගොඩනැගිලි හා ඉදිකිරීම් ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීම**

විවිධ රජයේ ආයතන විසින් ඉදිකරනු ලැබ, දැනට අතහැර දමා හෝ අර්ධ වශයෙන් ඉදිකරනු ලැබ නිසි භාවිතයට ගනිමින් නොපවතින ඉදිකිරීම පිළිබඳව මහා භාණ්ඩාගාරය විසින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහාය ඇතිව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තොරතුරු රැස් කරනු ලැබ ඇත. එකී තොරතුරු අනුව හඳුනා ගනු ලැබ ඇති ඌන උපයෝජිත හා අර්ධ වශයෙන් ඉදිකිරීම් සිදු කරනු ලැබ ඇති ගොඩනැගිලි 2,972කට අදාළව දැනට පවතින භෞතික තත්ත්වය පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, එම ගොඩනැගිලි ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමට හැකි වන පරිදි අදාළ අමාත්‍යාංශ සහ ආයතන විසින් කඩිනමින් විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**02. ඉන්දියානු බහු ආංශික ප්‍රදාන ආධාර යටතේ නැගෙනහිර පළාත තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ඉන්දියානු බහු ආංශික ප්‍රදාන ආධාර යටතේ නැගෙනහිර පළාත තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුමක් 2025-04-05 දින අත්සන් කරනු ලැබ ඇති අතර, ඒ යටතේ නැගෙනහිර පළාතේ සංවර්ධන අවශ්‍යතා සපුරාලන ව්‍යාපෘති 33ක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 2,371.83ක ප්‍රදානයක් ලබා දීමට ඉන්දීය රජය එකඟතාව පළ කර ඇත. එකී අවබෝධතා ගිවිසුමට අනුව ක්‍රියාත්මක කිරීමට නියමිත එක් එක් ව්‍යාපෘතියට අදාළව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය අතර වෙන් වෙන් වශයෙන් අවබෝධතා ගිවිසුම් අත්සන් කළ යුතුව තිබේ. ඒ අනුව, ඉන්දියානු බහු ආංශික ප්‍රදාන ආධාර යටතේ නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති 33ට අදාළ වන අවබෝධතා ගිවිසුම් 33, ඉන්දියානු මහ කොමසාරිස්වරයා සමඟ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් තැබීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

03. **ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ඩැනියෙල් එස්. සැන්ඩර්ස් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය සඳහා අරමුදල් ලබා ගැනීම**

1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත යටතේ පිහිටුවා ඇති ජාතික සමාජ සංවර්ධන ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් උපාධි ප්‍රදානය කිරීමට බලයලත් ආයතනයකි. අදාළ පනතේ විධිවිධාන ප්‍රකාර ව ආයතනයේ අරමුදලට ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඕනෑම ප්‍රභවයකින් පරිත්‍යාග, තෑගි හෝ ප්‍රදාන හරහා ඕනෑම මුදලක් ලබා ගැනීමට හැකියාව පවතී. මහාචාර්ය ඩැනියෙල් සෙල්වරාජා සැන්ඩර්ස් මහතා ශ්‍රී ලංකාවේ සමාජ වැඩ ආයතනයේ සමාජ වැඩ පිළිබඳ මුල් අධ්‍යාපනඥයෙක් වශයෙන් කටයුතු කර ඇති අතර, එහි පීඨ මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් ද 1955-10-01 දින සිට 1957-10-03 දින දක්වා කටයුතු කර තිබේ. ඒ මහතා මිය යාමෙන් පසු, ඔහුට ගෞරවයක් වශයෙන් ඔහුගේ බිරිඳ වන ක්‍රිස්ටෝබෙල් සී. සැන්ඩර්ස් මහත්මිය 1996 වර්ෂයේදී ජාතික සමාජ සංවර්ධන ආයතනයේ මහාචාර්ය ඩී. සැන්ඩර්ස් එන්ඩෝව්මන්ට් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ආරම්භ කිරීම සඳහා අරමුදල් සලසා දී ඇත. එමගින්, මේ වන විට සිසුන් 14දෙනෙක් සඳහා ශිෂ්‍යත්ව පිරිනමා තිබේ. ක්‍රිස්ටෝබෙල් සී. සැන්ඩර්ස් මහත්මිය 2023 වර්ෂයේදී අභාවප්‍රාප්ත වී ඇති අතර, දිවංගත ක්‍රිස්ටෝබෙල් සී. සැන්ඩර්ස් භාරයේ එක් කොටසක් වශයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 75,000ක මුදලක් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ශිෂ්‍යත්ව සඳහා හිමි වී ඇති බව එම භාරයේ භාර කළමනාකරු විසින් දැනුම් දී ඇත. ඒ අනුව, අදාළ භාර අරමුදල විසින් ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙත පිරිනමනු ලබන එම ප්‍රදාන පහසුකම විධිමත් පරිදි ලබා ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමටත්, සමාජ වැඩ සිසුන්ගේ ආදර්ශවත් කාර්යසාධනය වෙනුවෙන් ප්‍රදානයන් සඳහා සහ සමාජ වැඩසටහන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් එම මුදල භාවිත කිරීමටත් ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **2025-11-15 දින සිට 2026-06-14 දින දක්වා කාලය තුළ ඩීසල් (0.05% M.S.) බැරල් 1,400,000+/-5% (නැව් තොග 05ක්) ප්‍රසම්පාදනය කිරීම**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2025-11-15 දින සිට 2026-06-14 දින දක්වා කාලය තුළ ඩීසල් (0.05% M.S.) බැරල් 1,400,000+/-5% (නැව් තොග 05ක්) ප්‍රසම්පාදනය කිරීම සඳහා දිගුකාලීන කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීම පිණිස එම සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසුකරුවන් 07 දෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කරනු ලැබ තිබේ. ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව එකී ප්‍රසම්පාදනය සිංගප්පූරුවේ M/s. Trafigura Pte. Ltd. වෙත ප්‍රදානය කිරීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **2025 අංක 01 දරන මෝටර් වාහන (මත්ද්‍රව්‍ය) නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම**

මහාමාර්ගයක මෝටර් වාහනයක් ධාවනය කරනු ලබන රියදුරෙකු විසින් මත්ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇති බවට පොලිස් නිලධාරියෙකු විසින් සැක කරනු ලබන අවස්ථාවක පරීක්ෂා කරනු ලැබීම සඳහා එම තැනැත්තා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු බව මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ දක්වා තිබේ. එහෙත්, එකී නිශ්චය කිරීම සඳහා පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ක්‍රමය සහ ආකාරයත්, මත්ද්‍රව්‍ය ගෙන ඇතැයි සලකනු ලැබිය යුතු මත්ද්‍රව්‍ය සාන්ද්‍රණයේ ප්‍රමාණය පිළිබඳව විධිවිධාන ඇතුළත් නියෝග නිකුත් කර නොතිබුණි. එබැවින්, මත්ද්‍රව්‍ය භාවිත කොට රිය පදවනු ලබන රියදුරන් පරීක්ෂා කිරීමට හැකි වන පරිදි විධිවිධාන ඇතුළත් කරමින් (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ 2025 අංක 01 දරන මෝටර් වාහන (මත්ද්‍රව්‍ය) නියෝග, අංක 2452/40 හා 2025-09-04 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස වැඩබලන ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **අධිවේගී මාර්ගවල ධාවනය කරනු ලබන වාහනවල ගමන් ගන්නා මගීන් විසින් ආසන පටි පැළඳීම අනිවාර්ය කරමින් මෝටර් වාහන පනත යටතේ සාදන ලද නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම**

අධිවේගී මාර්ගවල සිදු වන රථවාහන අනතුරු දිනෙන් දින ඉහළ යාම හේතුවෙන් මරණ සහ බරපතල තුවාල සිදුවීම අවම කිරීම පිණිස අංක 2455/29 හා 2025-09-25 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ සාදන ලද 2011 අංක 2 දරන මෝටර් වාහන (අධිවේගී මහා මාර්ග) නියෝග සංශෝධනය කරනු ලැබ ඇත. එමඟින්, අධිවේගී මාර්ගවල ධාවනය කරනු ලබන වාහනවල සියලුම ආසනවල ගමන් ගන්නා තැනැත්තන් සඳහා ආසන පටි පැළඳීම අනිවාර්ය කර තිබේ. ඒ අනුව, එකී සංශෝධිත නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස වැඩබලන ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීම පිණිස නව පනතක් හඳුන්වා දීම සහ 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්, නැව් භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන්, බහාලුම් ක්‍රියාකරුවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ පනත සංශෝධනය කිරීම**

කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීමට සහ 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්, නැව් භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන්, බහාලුම් ක්‍රියාකරුවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ පනත සංශෝධනය කිරීමට 2024-12-18 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත් සඳහා නීතිපතිගේ නිෂ්කාශන ලැබී ඇත. එකී පනත් කෙටුම්පත් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම පිණිස පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කරමින් අවශ්‍යතා, ප්‍රමුඛතා හා කාලරාමු හඳුනාගෙන ඒ ආශ්‍රිතව අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු බඳවාගැනීම් ප්‍රමාණයන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් නිලධාරි කමිටුවක් පත් කිරීම පිණිස 2024-12-30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එම කමිටුව වෙත ඒ ඒ අමාත්‍යාංශ විසින් එම අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතනවල පවතින කනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන, 2025-10-02 දින පැවති එම කමිටු රැස්වීමේදී කරනු ලැබ ඇති නිර්දේශ පරිදි පහත සඳහන් බඳවාගැනීම් සිදු කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ සහ ආයතන වෙත අනුමැතිය ලබා දීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

| අනු අංකය | අමාත්‍යාංශ/පළාත් සභා/ කොමිෂන් සභා | බඳවාගැනීම් සඳහා කමිටුව විසින් නිර්දේශ කරන ලද තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | 79 |
| 2. | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | 120 |
| 3. | වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 44 |
| 4. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 17 |
| 5. | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය | 123 |
| 6. | වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය | 01 |
| 7. | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 310 |
| 8. | ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය | 01 |
| 9. | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | 01 |
| 10. | ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 48 |
| 11. | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | 54 |
| 12. | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය | 06 |
| 13. | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය | 355 |
| 14. | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 5,198 |
| 15. | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | 213 |
| 16. | බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 1,261 |
| 17. | ජාතික පොලිස් කොමිෂන් සභාව | 02 |
| 18. | උතුරු පළාත් සභාව | 115 |
| 19. | සබරගමුව පළාත් සභාව | 11 |
| 20. | වයඹ පළාත් සභාව | 85 |
| 21. | උතුරු මැද පළාත් සභාව | 89 |
| 22. | බස්නාහිර පළාත් සභාව | 414 |
| මුළු සංඛ්‍යාව | | 8,547 |

## 09. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස දැනට සේවය කරනු ලබන ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ.කොතලාවල මහත්මිය 2026-02-04 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිතව ඇති අතර, 2025-11-04 දින සිට 2026-02-03 දින දක්වා ඒ මහත්මියට විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ.කොතලාවල මහත්මිය විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගනු ලබන කාලසීමාව තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ පූර්ණකාලීනව වැඩබැලීම සඳහා දැනට බස්නාහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස සේවය කරනු ලබන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ

නිලධාරි කහඳ කනත්තගේ සරත් මහතා පත් කිරීමටත්, ඉන් අනතුරුව 2026-02-04 දින සිට ඒ මහතා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ස්ථිර පදනමින් පත් කිරීමටත් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. ආයුර්වේද කොමසාරිස් ජනරාල් තනතුරට පත් කිරීම

මේ වන විට පුරප්පාඩුව පවතින ආයුර්වේද කොමසාරිස් ජනරාල් තනතුර සඳහා දැනට කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස්වරියක ලෙස සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනී ඒ.එම්.ජී.එන්.දීප්ති සුමනසේන මහත්මිය වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. නව අධිකරණ ස්ථාපිත කිරීම සඳහා ඉඩ පහසුකම් ලබා දීම

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2025-2029) ප්‍රකාර ව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරයන් ක්‍රියාත්මක කිරීම සඳහා නව මහාධිකරණ කිහිපයක් කඩිනමින් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, කඩිනමින් නව මහාධිකරණ 04ක් ස්ථාපිත කිරීම සඳහා දැනට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය භාරයේ පවතින පහත සඳහන් ලිපිනයන්හි පිහිටි ගොඩනැගිලි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත භාර දීම පිණිස සිය අමාත්‍යාංශය විසින් පියවර ගනු ලබන බවට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය දැනුම්වත් කරන ලදුව, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී:

* අංක B 88, ග්‍රෙගරි පාර, කොළඹ 07.
* අංක C 76, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
* අංක B 108, විජේරාම පාර, කොළඹ 07.
* අංක B 12, ස්ටැන්මෝර් චන්ද්‍රවංකය, කොළඹ 07.

12. ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීම පිණිස ආයතනයක් තෝරා ගැනීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීම පිණිස ආයතනයක් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අදාළ ප්‍රසම්පාදනය සඳහා ද්විත්ව අදියර ලංසු තැබීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවා ඇති අතර, ආයතන හතරක් (04) විසින් අභිලාෂ ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කර තිබේ. එකී අභිලාෂ ප්‍රකාශ කිරීම් ඇගයීමේ ක්‍රියාවලියෙන් අනතුරුව ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි අදාළ සුදුසුකම් සපුරා තිබූ Giesecke & Devrient Asia Pacific Limited, Hong Kong වෙතින් යෝජනා කැඳවා ඇත. එම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික සහ මූල්‍ය යෝජනා ඇගයීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීමේ ප්‍රසම්පාදනය එකී ආයතනය වෙත පිරිනැමීම ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර ඇත. එකී නිර්දේශය මත පදනම්ව, අදාළ ප්‍රසම්පාදනය Giesecke & Devrient Asia Pacific Limited, Hong Kong වෙත ප්‍රදානය කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********